**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය - 2016**

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2003 අංක 01 දරන ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලියේ 17 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි .

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

2016 වර්ෂය සඳහා මුදලින් ලද රු.2,220,982 ක පොලී ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දැක්වීම වෙනුවට මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.52,662,824 ක් වූ දේපල පිරියත උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ගලපා නොතිබූ පෙර වර්ෂයේ ගැලපීම් රු.942,854 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගලපා තිබුණු අතර ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයේ පෙර වර්ෂ ගැලපීම් ලෙස දක්වා තිබුණේ රු.56,349 කි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල තුල්‍යතාවය පිළිබඳව විගණනයේදී ප්‍රශ්නකාරී විය.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම් අත්පත් කරගැනීමේ වටිනාකම වත්කම් ලේඛනය සමඟ සැසඳීමේදී රු.308,130 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 11වන කොටසෙහි 15(V) උපවගන්තිය | උසස් අධ්‍යාපන ආයතනයන් විසින් පවත්වනු ලබන පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබාගත යුතු වුවත්, 2016 වර්ෂයේදී පවත්වා තිබුණු පාඨමාලා 03 ක් සඳහා එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 05 දෙනෙකුගේ පැමිණීම සනාථ කර ගැනීමකින් තොරව රු.7,623,341 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.15,130,687 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,613,509 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.11,517,178 කින් වර්ධනය වී තිබුණි. වෙනත් පුනරාවර්තන වියදම් රු.7,947,535 කින් අඩුවීම සහ උපයන ලද ආදායම් රු.3,993,424 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අතිරික්තය විචලනයන් සහිතව වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැළපීමෙන් පසුව 2012 වර්ෂයේ රු. 26,189,085 ක් වූ දායකත්වය 2016 වර්ෂය වන විට රු.58,912,652 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ ජංගම අනුපාතය 7.8 ක් වුවද, ජංගම වත්කම් තුළ සියයට 49 ක් නියෝජනය කරනුයේ කෙටිකාලීන ආයෝජන හා මුදල් ශේෂය වූ බැවින් ආයතනයේ සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුළ රඳවා ඇති බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

ආයතනය විසින් ලබාදුන් තොරතුරු අනුව ආයතනයේ ප්‍රධාන අරමුණු වනුයේ අණුක ජෛව විද්‍යාව සහ සමාන්තර ක්ෂේත්‍රයන්හි ජාතික හා ජාත්‍යන්තර රැකියා වෙළඳපොළට ගැලපෙන උසස් තත්ත්වයේ පශ්චාත් උපාධිධාරීන් බිහි කිරීම, ජෛව තොරතුරුවේදය ක්ෂේත්‍රයෙහි ප්‍රවීණතා මධ්‍යස්ථානයක් වෙමින් ජාතික සංවර්ධනයට දායකවීම, සහෝපකාරී පරිසරයක් සහ සහයෝගීතා සංස්කෘතියක් ඇති කිරීම, සමාජ වගකීම් ප්‍රවර්ධනය කරමින් සමාජ උන්නතිය සඳහා ඉගැන්වීම සහ සේවා සැපයීම මගින් ඉපයීම් උපරිම කිරීම හා යහපාලනය වේ.

එම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 ජුලි 05 දිනැති 38 වෙනි මුදල් හා කළමනාකරණ කමිටු වාර්තාව අනුව අණුක ජෛවවේද තාක්ෂණයන් පිළිබඳ කෙටිකාලීන පුහුණු පාඨමාලාව (Training Course in Cell Culture Techniques) සඳහා රු.500,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එම පාඨමාලාව පවත්වා නොතිබුණි.

(ආ) ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මේ පරමාර්ථ අංක 04 යටතේ ඉගැන්වීම් සහ සේවා සැපයීම තුළින් ජනනය වන අරමුදල් උපරිම කරගැනීම සඳහා ව්‍යාපාර සංවර්ධන ඒකකය ශක්තිමත් කිරීමේ උපාය මාර්ග හඳුන්වා දී තිබුණි. ඒ යටතේ නීති උපදෙස් හා උපදේශනය, ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම, පර්යේෂණ සොයාගැනීම් වෙළෙඳපළගත කිරීම, පියයුරු පිළිකා සඳහා රෝග නිශ්චය කිරීමේ සේවාව ලබාදීම හා පියයුරු පිළිකා සම්බන්ධයෙන් සිදුවන විකෘති වීම් පරීක්ෂා කිරීම් (Mutation Testing for Brest Cancer) යන ක්‍රියාකාරකම් දක්වා තිබුණද වර්ෂය තුළ පර්යේෂණ 02 ක් පමණක් සිදුකර තිබුණි. පියයුරු පිළිකා සඳහා අදාලවන ජාන විකෘති හා හඳුනාගැනීම සඳහා කරනු ලබන පර්යේෂණ 2016 වර්ෂය සඳහා සිදුකර නොතිබුණි. මේ අනුව සැලැස්මේ අරමුණු ඉටුකරගැනීමට ආයතනය විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ජෛව තොරතුරුවේද විද්‍යාපති උපාධි පාඨමාලාව සඳහා 2012 වර්ෂයෙන් පසු සිසුන් බඳවාගැනීම් සිදුකර නොතිබුණු අතර 2015 වර්ෂයේ සිට එම පාඨමාලා විෂය අන්තර්ගතයන් සමාලෝචනය සිදු කරමින් පැවතුණි. ඒ වෙනුවෙන් 2015 සැප්තැම්බර් සිට විගණිත දින වූ 2017 පෙබරවාරි 28 දින දක්වා සමාලෝචන රැස්වීම් 07 ක් පවත්වා තිබුණු අතර පාඨමාලා සඳහා යෝජිත නීති කෙටුම්පත් කර අධ්‍යයන මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණද පාඨමාලා නැවත ආරම්භ කළ හැකි කාල සීමාව තීරණය කර නොතිබුණි. පාඨමාලාව ආරම්භ කිරීම වසර 04 ක් ප්‍රමාද වීම හේතුවෙන් පාඨමාලාව හැදෑරීමට අපේක්ෂිත සිසුන්ට එම අවස්ථාව මඟ හැරී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජෛව තොරතුරුවේද පශ්චාත් උපාධි පාඨමාලාවෙන් දක්ෂතම සිසුන් සඳහා රන් පදක්කම් ලබාදීම වෙනුවෙන් 2015 ජුලි මාසයේ දී පෞද්ගලික පාර්ශවයකින් රු.200,000 ක මුදල් පරිත්‍යාග ලැබී තිබුණු අතර එය සමාලෝචිත වර්ෂය තුළ කාලීන තැන්පතුවල ආයෝජනය කර තිබුණි. 2015 වර්ෂ අවසානයේ ඉහත පාඨමාලාව සඳහා උපාධි ප්‍රදානෝත්සවය පවත්වා තිබුණද අපේක්ෂිත පරිදි දක්ෂතම සිසුන් වෙත රන් පදක්කම් ලබා දීම සඳහා කටයුතු කර නොමැති බැවින් පරිත්‍යාගශීලීන්ගේ අපේක්ෂිත අරමුණ ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ පවතින පරිත්‍යාග ගිණුම් දෙකක වසර ගණනාවක සිට පවතින එකතුව රු.1,991,832 ක හර ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

----------------------------

වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු 2,791,677 ක ප්‍රාග්ධන ප්‍රදාන සමාලෝචිත වර්ෂය තුළ අදාළ කාර්යයන් සඳහා යොදාගෙන නොතිබු අතර, එම මුදල පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම් සඳහා වූ රජයේ ආධාර ගිණුමට මාරු කර තිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

-------------------------------

අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 03ක් පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර, පුරප්පාඩු වූ එක් තනතුරක් වන සෛල සහ අණුක ජෛව විද්‍යාරෝග නිරෝධවේදය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව (MSc in Cellular & Molecular Immunology) සඳහා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර වෙනුවෙන් කොන්ත්‍රාත් පදනම මත දේශකවරියක් බඳවාගෙන 2016 වර්ෂය තුළදී පුනරාවර්තන ප්‍රතිපාදනවලින් රු.678,796 ක දීමනා ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-----------------------------------------

**5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

---------------------

ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී භාණ්ඩාගාරයෙන් රු.9,520,000 ක මුදලක් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ තත්‍ය මිලදී ගැනීම් වටිනාකම රු.6,120,257 ක් වුයෙන් ආයතනයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව සැලසුම්කර තිබු මිලදී ගැනීම් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගබඩා පාලනය | වාර්ෂික තොග සමීක්ෂණය නිවැරදිව සිදුකර තොග පොත් යාවත්කාලීනව පවත්වාගෙන නොයාම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | කාර්ය මණ්ඩල අවශ්‍යතා අනුව අනුමත කාර්ය මණ්ඩල සංශෝධනයට සහ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ගිණුම්කරණය | ගිණුම් අතර මාරු කිරීම් සඳහා නිවැරදිව ජ්නල් සටහන් නොතැබීම සහ නිවැරදි ශේෂ පිරික්සුමක් පිළියෙල කර නොතිබීම. |